# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,922 — 1970 සැප්තැම්බර් 4 වැනි සිකුරාද — 1970.9.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 603 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| සභාතුරු—ඇබෑර්තු ... — ... | 607 | අය-වැය ලේඛන ... ... ... | 612 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 610 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ඉ දෙ නාන ගවෙනේ දන්වීම ... | 611 | විවිධ දන්වීම ... ... ... ... | 615 |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## පළාත් පාලන නිවේදන

### නගර සහ ග්‍රාම නාම වෙනස් කිරීම

පහත සඳහන් පළමු වැනි උප ලේඛනයේ ඇති ග්‍රාම නාමය දෙවැනි උපලේඛනය ප්‍රකාර වෙනස් කරන්නට යෙදුන බැව් මෙයින් දන්වමි. මේ ගැන අංක 14,916 හා 70.7.24 දතම ගැසට් පත්‍රයෙන් නිවේදනය කළ '' බටහිර දෙමපෙ '' යන්න මෙයින් අවලංගු කළ බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

1970 අගෝස්තු මස 25 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
කොළඹ 7.

ෆිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

| දිස්ත්‍රික්කය | පළමුවැනි උපලේඛනය | දෙවැනි උපලේඛනය |
|---|---|---|
| කොළඹ | හුණුපදන | දොමංප පහළ |

9-263—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී. බී. 74/39.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5(2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලනය, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලනය, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දිය.

#### ආඥාව

1969 ජනවාරි මස 9 වැනි දින හා අංක 14,835/7 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ උඩියන්කුලම කෝරළේ ගම් ප්‍රදේශය, ගලෙන් බිඳුනු වැව සහ කහටගස්දිගිලිය නමින් නව ගම් ප්‍රදේශ දෙකකට බෙදීම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය කරුණු සඳහා මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් විධිවිධාන මෙයින් සලස්වනු ලැබේ.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

අංක 5 දරන කොට්ඨාශය

බදුලු-මඩකලපු පාර අංක :—350, 352, 354, 356, 358, 360, 364, 366, 368, 372, 374, 376, 378, 380, 386, 388, 390, 392, 394, 394ඒ, 396, 398, 400, 402 සහ 416.

ඩැමේරියා පාර අංක :—11/10, 11/14. 11/15, 11/16, 11/17, සහ 11/20.

පරාක්‍රම මාවත අංක :—5, 7, 9, 11, 15, 19, 19/2, 19/3, 19/4, 19/5, 19/6, 19/7, 19/8, 19/9, 33, 37, 37/1, 43, 47, 51, 53, 55, 2, 2/3, 2/4, 2/5, 2/6, 2/7, 2/8, 2/9 2/10, 4, 10, 20, 24, 24/3, 24/4, 24/5, 24/6, 24/7, 24/8, 24/9, 24/10, 24/13, 24/14, 24/16, 24/17, 24/18, 24/19, 24/20, 24/21, 24/22, 24/24, 24/25, 24/26, 24/27, 24/28, 24/29, 24/30, 24/31, 24/32, 24/34, 26, 28, 30, 32, 34, 54, 54/1, 60, 60/1, 60/2, 60/3, 64, 66, 68, 68/1, 68/2, 68/3, 68/4, 72, සහ 72/1.

අංක 6 දරන කොට්ඨාශය

බදුලු මඩකලපු පාර අංක :—422, 424, 426, 428, 430, 434, 436, 438, 440, 446, 446/1, 450, 452, 454, 456, 460, 460/1, 464, 466, 468, 472, 474, 476, 478, 484, 484/1, 486, 486/4, 486/7, 486/8, 486/9, 486/11, 486/13, 486/14, 492, 498, 504, 506, 508, 510, 512, 514, 516, 518, 520, 522, 524, 524/1, 534 සහ 540.

පරාක්‍රම මාවත අංක :—31/5, 31/6, 31/7, 31/8, 31/9, 31/12, 31/15, 31/16, 31/17, 37/1, 37/2, 37/3, 37/4, 37/5, 37/7, 37/9, 37/10, 37/11, 37/12, 47/1, 47/2, 47/3, 47/4, 47/5, 47/6, 47/9, 47/10, 61, 69, 69/1, 69/2, 69/4, 69/6, 69/7, 69/8, 71, 73, 77, 77/2, 79/5, 81, 81/1, 85, 87, 87/1, සහ 93.

වරාදෙල පාර අංක :—7, 7/1, 2, 4, 6, 10, 18 සහ 20.

අංක 7 දරන කොට්ඨාශය

බදුලු-මඩකලපු පාර අංක :—349, 349/1, 359, 361, 363, 365, 367, 383, 383/1, 385, 387, 391, 391ඒ, 395, 397, 399, 405, 409, 411, 413, 415, 417, 419, 421, 423, 425, 425/1, 425/2, 425/4, 437, 437/1, 437/2, 437/3, 439, 441, 443, 445, 447, 449, 451, 457, 459, 461, 467, 475, 479, 481, 485, 487, 489, 491, 493, 495, 497, 499, 501, 503, 505, 507, 509, සහ 515.

මවුල්සිම පාර අංක :—7, 7/1, 7/2, 7/3, 7/6, 7/7, 7/8, 7/9, 7/10 7/11, 7/12, 7/13, 7/22, 2, 2/1, 4, 6, 10, 10/1, 16, 18, 20 සහ 22,

පාසැල පටුමග අංක :—9, 9/3, 17, 10, 12, 12/1, 12/2, සහ 12/4.

9–249—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 28/70.

## වැලිසර සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

### 1970 වර්ෂය සඳහා දේපළ බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 159 (1) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, සභාව විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්, වෙසෙසුම් සහ කොන්දේසි වලට යටත්ව, වැලිසර නගරය තුළ පිහිටා තිබෙන, ගොයම් වගාකර තිබෙන ඉඩම් හැර, සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ දේපළ බද්දක්, පිළිවෙලින් සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් දෙකකින් ගෙවිය යුතු අන්දමට, වැලිසර සුළු නගර සභාව විසින් 1970 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දීය.

9–248—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### ගම්සභා ආඥපනතේ අංක 17 (1) දරණ වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 පණතින් සංශෝධිත, ගම්සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 17(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහනුවර දිස්ත්‍රික්කයේ වැඩ බලන පළාත් පාලන සහකාරකොමසාරිස්, කෝනාරමුදියාන්සේලාගේ අබේසිංහ වන මා විසින් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත එක් එක් ගම්සභාවේ ප්‍රථම රැස්වීම එකී උපලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනින් නියමිත දිනයේදිද, එකී උපලේඛනයේ III වැනි තීරුවෙහි අනුරූප සටහනින් නියමිත වේලාවටද, එකී උපලේඛනයේ IV වැනි තීරුවෙහි අනුරූප සටහනින් නියමිත ස්ථානයේදිද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

කේ. එම්. අබේසිංහ,
වැඩ බලන පළාත් පාලන සහකාර කොමසාරිස් මහනුවර.

1970 සැප්තැම්බර් මස 1 දින,
මහනුවර, පළාත් පාලන කාර්යාලයේදිය.

### උපලේඛනය

| I වන තීරුව ගම්සභාවේ නම | II වන තීරුව දිනය | III වන තීරුව වේලාව | IV වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| පාතහේවාහැට ගන්දහය උතුර ගම්සභාව ... | 1970.9.13 ... | පෙ. ව. 10.00 ... | පාතහේවාහැට ගන්දහය උතුර ගම්සභා කාර්යාලය, අම්පිටිය |
| කුම්පනේ උඩපළාත බටහිර ... | 1970.9.13 ... | පස්වරු 2.30 ... | කුම්පනේ උඩපළාත බටහිර ගම්සභා කාර්යාලය, අලුවතිය, මහනුවර |

9–259—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥපනත

### ගම්සභා ආඥපනතේ 17 (1) වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම් සභා ආඥපනතේ (257 වැනි අධිකාරය) 17 (1) දරන වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, මන්නාරමේ පළාත් පාලන සහකාර කොමසාරිස් දේවරත්නම් ඩැන්පෝත් වන මා විසින්, මෙහි පහත උප ලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම සභාවට සභාපති කෙනෙකු පත් කර ගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයේදී, 3 වැනි තීරුවේ සඳහන් වේලාවේ දී, 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයේ දී පළමුවෙනි රැස්වීම මෙයින් කැඳවා සිටිනු ලැබේ.

දේවරත්නම් ඩැන්පෝත්,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මන්නාරම.

මන්නාරම, ප. පා. ස. කො. කාර්යාලයේදිය.
1970 සැප්තැම්බර් මස 1 වැනි දින.

### උපලේඛනය

| I වැනි තීරුව ගම්සභාවේ නම | 2 වැනි තීරුව දිනය | 3 වැනි තීරුව වේලාව | 4 වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| පෙරුන්කාලිපත්තු ... | 70.9.11 ,... | පෙ.ව. 10.00 ... | පෙරුන්කාලිපත්තු ගම්සභා කාර්යාලය, විඩත්තල්තිවු |

9–275—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 වර්ෂයේ අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මඩකලපුව ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, බර්ට්‍රම් ආර්නෝල්ඩ් ජෙයරාජා කාසිනාදර් වන මම, දකුණු කෝරලේ ගම්සභාවේ ප්‍රථම රැස්වීම 1970 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින සෙනසුරාදා පෙරවරු 10ට දකුණු කෝරලේ ගම්සභා කාර්යාලයේ දී මෙයින් කැඳවා සිටිමි.

බී. ඒ. ජේ. කාසිනාදර්,
මඩකලපුව ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

මඩකලපුව ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, මඩකලපුව,
1970 සැප්තැම්බර් මස 1 වැනි දින.

9–253—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

257 වැනි අධිකාරය වන ගම්සභා ආඥාපනතේ 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රත්නපුර පෙදෙසේ, පළාත් පාලන සහකාර කොමසාරිස්, අමරවික්‍රම රාජසිංහ කරුණාරත්න වන මම, රත්නපුර දිස්ත්‍රික්කයේ බබරබොටුව ගම්සභාවේ අංක 2 දරණ කොට්ඨාශයෙහි සභික, එච්. ඇම්. ට්. බී. හරස්ගම මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත් කරනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සැලකිල්ලට පත්ව, රත්නපුර දිස්ත්‍රික්කයේ බබරබොටුව ගම්සභාවේ අංක 2 දරණ කොට්ඨාශයෙහි සභික, එච්. ඇම්. ට්. බී. හරස්ගම මහතා, මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඒ. ආර්. කරුණාරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
රත්නපුර.

1970.8.24 වැනි දින,
රත්නපුර, පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලය.

9–270—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### ගම්සභා ආඥාපනතේ 17 (5) වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 පනතින් සංශෝධිත, ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17(5) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාතලේ දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, කෝනාර මුදියන්සේලාගේ අබේසිංහ වන මා විසින් මාතලේ දිස්ත්‍රික්කයේ ගම්පහසියපත්තුව ගම්සභාවට සභාපතිතුමෙකු තෝරාපත්කර ගැනීම පිණිස එකී ගම්සභාවේ රැස්වීමක් 1970 සැප්තැම්බර් මස 12 වෙනි දින පෙරවරු 10 ට අලුපත්වෙල පිහිටි ගම්පහසියපත්තුව ගම්සභා කාර්යාලයේදී මෙයින් කැඳවා සිටිනු ලැබේ.

කේ. ඇම්. අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මාතලේ.

1970 සැප්තැම්බර් මස 1 වැනි දින,
මාතලේ පළාත් පාලන කාර්යාලයේදීය.

9–265—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

(257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වගන්තියෙන් මා වෙත පැවරුන බලතල ප්‍රකාර, ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්, වික්‍රමරත්න කෙ ඕප්විලෙ ආරච්චි පටබැඳිගේ පර්සි අබේසිංහ වන මම ගාළු දිස්ත්‍රික්කයේ කතළුව ගම්සභාවෙහි අංක 4 දරණ කොට්ඨාශයෙහි සභික ගාර්දියේවාගේ ගුණවතී මහත්මිය සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුණකට වැඩි ගණනකට, තමන් තෝරා පත් කරගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සැලකීමකට පත්ව ගාළු දිස්ත්‍රික්කයේ කතළුව ගම්සභාවෙහි අංක 4 දරන කොට්ඨාශයෙහි සභික ගාර්දියේවාගේ ගුණවතී මහත්මිය මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනසිට තම සභිකත්ත්වය අත්හරිනලද බව. මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. කේ. ඒ. පී. පී. අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල.

පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලය,
ගාල්ල, 1970.8.21.

9–268—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරන ගම් සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම් සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර ත්‍රිකුණාමලයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, ධර්මලිංගම් වාමදේවන් වන මම, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සේරුවිල ගම් සභාවේ අංක 2 දරන කොටසේ නියෝජිත රත්නායක මුදියන්සේලාගේ විලියම් සිංඤෝ මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි වාර ගනනකට තමන් තෝරා පත්කර ගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සැලකීමකට පත්ව, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සේරුවිලගම් සභාවේ අංක 2 දරන කොටසේ නියෝජිත රත්නායක මුදියන්සේලාගේ විලියම් සිංඤෝ මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල කිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ධර්මලිංගම් වාමදේවන්,
ත්‍රිකුණාමලයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1970 අගෝස්තු මස 20 වැනි දින,
ත්‍රිකුණාමලයේ
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

9–278—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 17 (5) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලේකම්වසම් ගොඩ්වින් සිරිවර්ධන මා විසින් 1970 සැප්තැම්බර් මස 12 වැනි දින පස්වරු 2 ට කරදගොල්ල පිහිටි කොහොක ගම්සභා කාර්යාලයේදී, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ කොහොක ගම්සභාවේ රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

එල්. ජී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1970 සැප්තැම්බර් මස 27 වැනි දින,
නුවරඑළිය,
පළාත් පාලන කාර්යාලයේදීය.

9–267—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේයි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) 1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද, කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතට මාරුකරනු නොලැබූ ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයින් විසින් උසුලනු ලබද්දී, 1962 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුද හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකර හරිනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශ කරනු නොලැබූ තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් වූ විට, එම තනතුරුවලට පත්කරනු ලබන අය 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතෙහි 18 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට, ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) දයක මුදල් වශයෙන් ගෙවිය යුත්තාහ. අදළ නිලධාරීන්ගේ වැටුපෙන් සියයට හත හමාරක් (7½%) ඔවුන් පත්කරනු ලබන ප්‍රාදේශීය බලමංඩලය විසින් ඔවුන් වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ඉ) ස්ත්‍රීන්ද, වයස 55 ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,329 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට හතරක (4%) මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට තුනක (3%) දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඊ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(උ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඌ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(එ) අයදුම්කරුවන්, නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(ඒ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුයි.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම්, අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළහැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළතදී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු, නියමිත වැටුප් වැඩිවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගත්තා අය, තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ

5. හැම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිධලාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදානම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැල පෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අනාසාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර, ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :—

අවුරුදු :———, මාස :———, දින :———.

(ආ) උපන් දිනය :——.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඇ) පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—රෙජිමේන්තුව, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :—

15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරදක් අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### සැළසුම් නිලධාරි තනතුර

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලැබෙන අයදුම්කරු, පළමුවන වරට කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට අදාල වැටුප් පරිමාණය වර්ෂයකට රුපියල් 7,800—360×3—8,800/9,600—480×11—රු. 16,320 යනුවෙනි. එහි රුපියල් 9,600 හා රු. 14,400 යන වාර්ෂික වැටුප්වලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත. තෝරාගනු ලැබෙන අයදුකරු, පළපුරුද්ද අනුව සුදුසු වැටුප් පියවරක තබනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස.—1970 සැප්තැම්බර් මස 18 වැනි දිනට අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්, ලන්ඩන්හි නගර නිර්මාණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයින් විය යුතු අතර, සැළසුම් යෝජනා ක්‍රම සකස් කිරීම පිළිබඳව පළපුරුද්ද ඔවුනට තිබිය යුතුය.

(ඇ) ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධියක්, ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී. එස්.සී. උපාධිය, සිවිල් ඉංජිනේරු විද්‍යා ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය (ඒ. එම්. අයි. සී. ඊ.) හෝ නාගරික ඉංජිනේරු විද්‍යා ආයතනයේ ආශ්‍රිත සමාජිකත්වය (ඒ. එම්. අයි. එම්. ඊ.) යන මේ කිසියම් සුදුසුකමක් හිමි අයගේ අයදුම්පත් ද භාරගනු ලැබේ. කෙසේ වුවද, තෝරාගනු ලැබෙන අයදුම්කරු පත්වීම් දිනයේ සිට වර්ෂ 5ක් ඇතුළත ලන්ඩන්හි, නගර නිර්මාණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබාගත යුතු අතර, එකී සුදුසුකම් ලබා ගන්නා තෙක් ඔහුට වර්ෂයකට රු. 9,960ක් වන වැටුප් පෙත්තෙන් ඔබ්බට යා නොහැකිය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව පිළියෙළ කොට, 1970 සැප්තැම්බර් මස 18 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

6. ඉල්ලුම්පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. පෞද්ගලික වෘත්තියෙහි යෙදීම, තෝරාගනු ලැබෙන අයදුම්කරුට තහනම් වන අතර, කොළඹ නගර සීමාව ඇතුළත පදිංචි වන ලෙස ඔහුට නියම කරනු ලැබේ.

8. නියමිත දිනට පසුව, මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. කවර අන්දමකින් හෝ පෙළඹවීම් හේතු කොටගෙන, අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

10. සුදුසු අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

සී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ,
තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

9–295—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කම්බිකරු සහායක තනතුර—කඳපොල ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් 1970 සැප්තැම්බර් මස 30 දින පස්වරු 4 තෙක් මවිසින් භාරගනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 504—30×8—රු. 744.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස අවුරුදු 18ත් 35ත් අතර විය යුතුය.

(ආ) අයදුම්කරුවන් අඩු වශයෙන් සිංහල 7 වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුතුයි.

(ඇ) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය කම්බි ඇඹීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇඹීම පිළිබඳ කම්කරු දෙපාතමේන්තුව මගින් මෙහෙයවන පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අය විය යුතුය.

නැතහොත්

(ඇ) අයදුම්කරුවෝ පළාත් පාලන ආයතනයක, ආණ්ඩුවේ ආයතනයක හෝ සංස්ථාවක විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් ඇතිව සිටිය යුතුයි. ඉහත (ඇ) කොටසේ සඳහන් සහතික ලබා ගත් පසු නගර විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු දෙකක පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත් ඔවුන් අනිත් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සළකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත් පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සැරසුනුලව පිළියෙල කොට ඉහත සඳහන් දිනට සහ වේලාවට හෝ එයට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ජේ. ඇම්. චාර්ලිස් අප්පු,
සභාපති,
කඳපොල ගම්සභාව.

1970 අගෝස්තු මස 25.
කඳපොල ගම්සභා කායාලයේදී.

9–308—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

## බෙන්තොට සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ බෙන්තොට සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 12 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1. 1966 ජනවාරි 12 වැනි දින අංක 14,734 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ විටින් විට සංශෝධනය කරනු ලැබූ අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ බෙන්තොට සුළු නගර සභාවේ අතුරු ව්‍යවස්ථා, එහි වූ අගට පහත සඳහන් විෂයයන් එක් කිරීමෙන් මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

ගම් වේලා යකඩ කිරීම,

ගැලුම් 50කට වැඩියෙන් භූමිතෙල් ගබඩා කිරීම,

පැට්‍රල් ගබඩා කිරීම,

ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීම.

9-286—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

එල්. ජී.—බී. 8/70.

## අගලවත්ත සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ අගලවත්ත සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 12 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

#### මළාපවහනය

1. සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XIX වැනි කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා මාස් පතා සභාවට ගෙවිය යුතු මළාපවහනය කිරීමේ ගාස්තුව, ඉවත් කරනු ලබන එක් එක් බාල්දියට රුපියල් දෙකක් බැගින් විය යුතු ය.

2. අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව, එම ගාස්තුව ගෙවිය යුතු මාසයට පසුව එළඹෙන මාසයේ දහවැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

#### කසළ ශෝධනය

3. සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XX වැනි කොටසේ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා මාස් පතා සභාවට ගෙවිය යුතු කසළ ශෝධන ගාස්තුව, එකී කසළ ශෝධන සේවයෙන් ප්‍රයෝජනයක් සැලසෙන යම්කිසි ස්ථානයක් සම්බන්ධයෙන් ශත පනහක් බැගින් විය යුතුය.

4. අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව, එම ගාස්තුව ගෙවිය යුතු මාසයට පසුව එළඹෙන මාසයේ දහවැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

5. අගලවත්ත සුළු නගර සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XV වැනි කොටසේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා "වෙළඳ පොළ සීමාව" යනු අගලවත්ත සුළු නගර සභාවේ පාලන සීමාවන් ඇතුළත ප්‍රදේශය විය යුතුය.

6. අගලවත්ත සුළු නගර සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XXII වැනි කොටසේ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා, රථවාහන වෙනුවෙන් හඳුනා ගැනීමේ අකුරු පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතුය :—

| | |
|---|---|
| මෝටර් රියක්, රෝද තුනේ මෝටර් රියක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ රෝද තුනේ සයිකලයක් නොවන්නාවූ සෑම රථවාහනයකටම ... | ... අ.සු.වා. |
| සෑම බයිසිකලයක් හෝ රෝද තුනේ සයිකලයක් හෝ බයිසිකල් රියක් හෝ කරත්තයක් නැතහොත් රෝද තුනේ සයිකල් රියක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කිරීමේ දී ... | ... අ.සු.වෙ.බ. |
| (ආ) වෙළඳ කාර්යයන් නොවන වෙනත් දෙයකට ... | ... අ.සු.න.බ. |
| ගොන් දෙන්නා බඳින සෑම තිරික්කලයක් හෝ කරත්තයකටම ... | ... අ.සු.බ.ක. |
| තනි ගොනා බඳින සෑම තිරික්කලයක් හෝ කරත්තයකටම ... | ... අ.සු.බ.ඛ. |
| සෑම අත්කරත්තයකටම ... | අ.සු.අ.ක. |

9-288—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

එල්. ජී.—බී. 29/65.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව උතුර ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 12 වන දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

ගම් සභාව විසින් පිළිගන්නා ලද, වාහන හා සතුන් පිළිබඳ බද්දට අදාල වන සම්මත අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා, වාහන හඳුනා ගැනීමේ අක්ෂර පහත සඳහන් පරිදි විය යුතු ය :—

| | |
|---|---|
| 1. කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අත්දමක වාහනයක් සඳහා ... | ... අ.උ.ග.වා. |
| 2. ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ... අ.උ.ග.බ.ක. |
| 3. තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ... අ.උ.ග.බ.ඛ. |
| 4. අත් කරත්තයක් හෝ ජින්රික්ෂෝ රථයක් සඳහා ... | ... අ.උ.ග.අ.ක. |
| 5. බයිසිකලයක් සඳහා ... | ... අ.උ.ග.බ. |

9-287—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## බණ්ඩාරගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වන වගන්ති යටතේ බණ්ඩාරගම සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එම ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු 12 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කොප්පරා සෑදීම.
(හොණ්ඩර 10කට වැඩියෙන්) කොප්පරා ගබඩා කිරීම.
යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් සිඳීම.
(ගැලුම් 50කට වැඩියෙන්) පොල් තෙල් ගබඩා කිරීම.
කබොක් සඳහා වළවල් හෑරීම.
බොරළු සඳහා වළවල් හෑරීම.
පිදුරු ගබඩා කිරීම.
මිනිරන් සුද්ධ කිරීම හෝ ගබඩා කිරීම.
දර ගබඩා කිරීම.
භූමිතෙල් බෙදා හරින ස්ථානයක් හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
ඩීසල් තෙල් හෝ පැට්‍රෝල් බෙදා හරින ස්ථානයක් හෝ ගබඩාවක් පවත්වා ගෙන යාම.
මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම.
ස්වර්ණාභරණ සෑදීම.
සහල් මෝලක් හෝ සහල් පාහින යන්ත්‍රයක් පවත්වා ගෙන යාම.
කෙඳි වර්ග හෝ කෙඳි භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම.
කම්මලක් පවත්වා ගෙන යාම.
දැව ගබඩා කිරීම.
වෝල්කනයිසිං කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
බේලෙක් වැඩපලක් පවත්වා ගෙන යාම.
හිස්ගෝනි ගබඩා කිරීම.
ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් සාදන ස්ථානයක් පවත්වා ගෙන යාම.
ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් ගබඩා කිරීම.
ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන හෝ සර්විස් කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
අම්ලකර වායුව පාවිච්චි කරන වැඩ පලක් පවත්වාගෙන යාම.
(හොණ්ඩර 5කට වැඩියෙන්) කොච්චි පුළුන් ගබඩා කිරීම.
බීඩී සාදන ස්ථානයක් පවත්වා ගෙන යාම.
මෝටර් රථවාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.
බැටරි පූරවන ස්ථානයක් පවත්වා ගෙන යාම.
ගිනි පෙට්ටි සාදන ස්ථානයක් පවත්වා ගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් කළුගල් කඩන ස්ථානයක් පවත්වා ගෙන යාම.
මඩු කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම.
(මිටි 10කට වැඩියෙන්) දුම්කොළ ගබඩා කිරීම.
ඡායාරූප ශාලාවක් පවත්වා ගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන මෝලක් පවත්වා ගෙන යාම.
අත් යන්ත්‍රවලින් හෝ බලවේග යන්ත්‍රවලින් රෙදි වියන ස්ථානයක් පවත්වා ගෙන යාම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය !—

කොම්පෝස්ට් පොර හෝ කෘත්‍රිම පොර හොණ්ඩර 10කට වැඩියෙන් ගබඩා කිරීම.
විනාකිරි සෑදීම.
සබන් සෑදීම.
සතුන්ගේ ලේ හෝ අතුනුබහන් උණු කිරීම.
හම් ගබඩා කිරීම.
මාළු අයිස් දැමීම.
ලෑලි පොඟවා සකස් කිරීම.
බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ කුළුබඩු අඹරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
(හොණ්ඩර 5කට වැඩියෙන්) කරවල ගබඩා කිරීම.

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(හොණ්ඩර 25කට වැඩියෙන්) සිමෙන්ති ගබඩා කිරීම.
කෙඳි වර්ග සායම් කිරීම.
ගඩොල් සෑදීම හෝ ගබඩා කිරීම.
උළු සෑදීම හෝ ගබඩා කිරීම.
හුණු ගල් පිලිස්සීම, ගබඩා කිරීම හෝ සකස් කිරීම.

9–284—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## දොඩන්දූව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ දොඩන්දූව සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1966 දෙසැම්බර් මස 16 වැනි දින අංක 14,726 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා, එහි වූ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ "දොඩන්දූව ප්‍රසිද්ධ වෙළඳ පොළෙහි සිට යාර 550ක අධි විෂ්කම්භයක් ඇති කවයක් තුළවූ ප්‍රදේශය විය යුතුය" යන පාඨය වෙනුවට "සුළු නගර සභා ආඥාපනත යටතේ කරන ලද ආඥාවේ දෙවැනි උප ලේඛනයෙහි විස්තර කරනු ලැබ 1952 අගෝස්තු මස 29 වැනි දින අංක 10 440 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද දොඩන්දූව නගරයේ සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය විය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9–285—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

### (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙසින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත්කරන්නට යෙදුන බවය.

ඊ. එෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| **යාපනය දිස්ත්‍රික්කය** | | |
| වඩ්ඩුකෝඩ්ඩෙයි ගම් සභාව | | |
| 3 | ... | සින්නතම්බි ලෙච්චුමනනාදන් |
| අරාලි ගම් සභාව | | |
| 6 | ... | රාමනාදර් කන්දමුත්තු |
| **මන්නාරම දිස්ත්‍රික්කය** | | |
| මන්කාලෙයි ගම් සභාව | | |
| 7 | ... | ඥානමුත්තු මීරන්ඩා තොම්පිලිප්පු මීරන්ඩා |
| **බදුල්ල දිස්ත්‍රික්කය** | | |
| පම්පිපොල ගම් සභාව | | |
| 7 | ... | අත්තනායක මුදියන්සේලාගේ ජයවර්ධන |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | | |
| බලන්ගොඩ නගර සභාව | | |
| 1 | ... | පල්ලෙ කුඹුරෙ වඩුදුරගේ සිමියොන් |

9–277—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත
## (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙළින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ටී. එෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය. | අපේක්ෂකයාගේ නම |
|---|---|
| | **මාතලේ දිස්ත්‍රික්කය** |
| | උඩුගොඩ උඩසිය පත්තු බටගිර ගම් සභාව |
| 10 ... | දවිත් සිංඤෝ මදුරා ගොඩයලෑගෙදර |
| | වගපනහ උඩසිය පත්තු ගම් සභාව |
| 5 | හේරත් මුදියන්සේලෑ උඩගෙදර උක්කු බණ්ඩා |
| | **හම්බන්තොට දිස්ත්‍රික්කය** |
| | කිරම ගම් සභාව |
| 3 ... ... | විජමුනිගේ ජේම්ස් |
| | **රත්නපුර දිස්ත්‍රික්කය** |
| | කුරුවිට කෝරළේ මැදපත්තු ගම් සභාව |
| 7 ... ... | රාජගේ පීටර් ජයසිංහ |

9-276—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## වත්තල මාබෝලෙ නගරය

### මුදල් රෙගුලාසි 12 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### 1970 අය-වැය ලේඛනය

1970 අය-වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයැයි ගණන් බලන ලද පහත දක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට ම විසින් තීරණය කර ඇත.

**ඉතිරිවේයැයි ගණන් බලන ලද වැය ශීර්ෂයන් හා මුදල්**

| | රු. ශ. |
|---|---|
| ඩී.—නගර සභා ගොඩනැගිලි හා ඉඩම්— | |
| (7) අළුත් කර්මාන්ත ... ... ... | 39,200 0 |
| එකතුව ... | 39,200 0 |

**අතිරේක වැය අවශ්‍යවී ඇති ශීර්ෂයන් හා මුදල්**

| | රු. ශ. |
|---|---|
| (1) බී.—මංමාවත් :— | |
| (4) වීථි ආලෝක කිරීම ... ... | 10,000 0 |
| (2) ඊ.—සනීපාරක්ෂාව :— | |
| (1) සාමාන්‍ය— | |
| (ඇෆ්) උපකරණ හා බෙහෙත් ... ... | 500 0 |
| (3) ඊ.—සනීපාරක්ෂාව :— | |
| (2) කසල ශෝධනය— | |
| (බී) කරත්ත, ගොන් හා ලොරි ... | 5,000 0 |
| (4) ඊ.—සනීපාරක්ෂාව :— | |
| (3) වැසිකිලි පවිත්‍ර කිරීම— | |
| (ඒ) වේතන හා වැටුප් ... ... | 20,000 0 |
| (5) ඊ.—සනීපාරක්ෂාව :— | |
| (3) වැසිකිලි පවිත්‍ර කිරීම— | |
| (අයි) අතිකාල දීමනා ... ... ... | 500 0 |
| (6) ඊ.—සනීපාරක්ෂාව :— | |
| (7) වෙළඳ පොලවල්— | |
| (බී) නඩත්තු කිරීම ... ... ... | 2,000 0 |
| (7) ජී.—සොහොන් බිම්— | |
| (1) වේතන ... ... ... | 1,200 0 |
| | 39,200 0 |

ඔලිවර් ගුරුසිංහ,
විශේෂ කොමසාරිස්,
වත්තල-මාබෝලෙ නගරය.

1970 ජූලි මස 12 වැනි දින,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
වත්තල-මාබෝලෙ නගරය.

9-290—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## කළුතර නගර සභාව

### 1970—1 වෙනි පරිපූරක අය-වැය ලේඛණය

| වැය ශීර්ෂය හා උප වැය ශීර්ෂස | මුදල රු. | ශ. | සභාවේ අනුමතිය |
|---|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් වරුන්ගේ වැටුප් … … | 1,250 | 0 | … 20.2.70 වෙනි දින සභා සම්මුති අංක 19 |
| ඒ.—(1) (ඒ) ලේකම් වරුන්ගේ වැටුප් … … | 2,750 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 |
| ඒ.—(1) (බී) ලිපිකරුවන්ගේ වැටුප් … … … | 3,000 | 0 | … එම |
| ඒ.—(1) (සී) කායඞාල කායඞ සභායකයන්ගේ වැටුප් … … | 1,500 | 0 | … එම |
| ඒ.—(1) (ඊ) විශ්‍රාම වැටුප් … … … | 4,100 | 0 | … 20.2.70 වෙනි දින සභා සම්මුති අංක 19 |
| ඒ.—(1) (ඊ) විශ්‍රාම වැටුප් … … … | 30,000 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 |
| ඒ.—(1) (ඊ) විශ්‍රාම වැටුප් … … … | 1,312 | 50 | … 19.5.70 වෙනි දින සභා සම්මුති අංක 5 |
| ඒ.—(2) (ඒ) (1) විවාහක දීමනා … … … | 1,500 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 |
| ඒ.—(2) (එච්) කරත්ත හා බෝට්ටු තහඩු ගාස්තු … … | 300 | 0 | … 21.3.70 වෙනි දින සභා සම්මුති අංක 32 |
| ඒ.—(2) (කේ) පිළිගැනීම් හා ප්‍රීති උත්සව … … | 250 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 (II) |
| ඩී.—(1) (ඒ) විවාහක දීමනා (තානායම් භාරකරු) … … | 160 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 |
| ඊ.—(1) (ඒ) මහජන පරීක්ෂකවරුන්ගේ ගාස්තු … … | 75 | 0 | … 20.2.70 වෙනි දින සභා සම්මුති අංක 19 |
| ඊ.—(1) (ඒ) මහජන පරීක්ෂකවරුන්ගෙ ගාස්තු … … | 5,400 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 (II) |
| ඊ.—(3) (ඒ) සෞඛ්‍ය අංශයේ වැටුප් … … | 7,000 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 |
| ඊ.—(6) (ඒ) ආයුර්වේද අංශයේ වැටුප් … … | 7,000 | 0 | … එම |
| ඊ.—(6) (බී) ආයුර්වේද බෙහෙත් සඳහා … … | 12,000 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 (II) |
| ඊ.—(6) (ඩී) ආයුර්වේද අංශයේ විවාහක දීමනා … … | 475 | 0 | … 18.6.70 වෙනි දින සභා සම්මුති අංක 25 |
| ඊ.—(7) (ඒ) සෞඛ්‍ය අංශයේ වැටුප් සඳහා … … | 500 | 0 | … එම |
| ඊ.—(7) (එච්) සෞඛ්‍ය අංශයේ විවාහක දීමනා … … | 75 | 0 | … එම |
| ජේ.—(4) (ඒ) විදුලි අංශයේ වැටුප් (නිළධාරීන්ට) … … | 17,000 | 0 | … එම |
| ජේ.—(4) (බී) විදුලි අංශයේ වැටුප් (සේවකයින්ට) … … | 3,000 | 0 | … එම |
| එම්.—(1) පුස්තකාලයේ නිළධාරීන්ට වැටුප් … … | 5,000 | 0 | … එම |
| එම්.—(5) පුස්තකාලයේ නිළධාරීන්ට විවාහක දීමනා … … | 120 | 0 | … එම |
| එකතුව … | 1,03,767 | 50 | |

එක්. ඇම්. වික්‍රමසිංහ,
කළුතර නගර සභාවේ සභාපති.

70.8.20 වෙනි දින,
කළුතර නගර සභා කායඞාලයේ දීය.

9–283—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## හැටන්-දික්ඔය නගර සභාව

### 1970 දෙවැනි පරිපූරක අය වැය ලේඛණය

| වැය ශීර්ෂය | – | | යෝජනා අංකය |
|---|---|---|---|
| ඒ.—2 (අයි) ගිණුම් පරීක්ෂක ගාස්තු … … | 4,200 | 0 | 1970 අගෝස්තු 18 වැනි දින අංක 11 |
| ඊ.—6 (බී) රෝහල් නඩත්තුව … … | 5,000 | 0 | |
| ජේ.—1 (ඩී) විදුලිය මිළට ගැනීම … … | 75,000 | 0 | |
| එකතුව … | 84,200 | 0 | |

ඉහත සඳහන් ප්‍රකාර සම්මත කර ගන්නා ලදී.

ඇම්. ජී.පී. ගුණවර්ධන,
හැටන්-දික්ඔය නගර සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 20 වැනි දින,
හැටන්,
හැටන්-දික්ඔය නගර සභා කාර්යාලයේ දීය.

9–282—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## දෙඩන්දුව සුළු නගර සභාව

### 1970 පළමුවැනි අතිරේක වැය ලේඛනය

### 1 වෙනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ/2/බී—ගමන් ගාස්තු … … … | 1,000 | 0 |
| ඩී/2/බී—කරත්ත, ගොනුන් … … | 275 | 0 |
| එකතුව … | 1,275 | 0 |

1970.7.24 දින පවත්වන ලද රැස්වීමේදී සම්මත කර ගන්නා ලදී.

සිරිපාල ජයසූරිය,
සභාපති,
දෙඩන්දුව සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
දෙඩන්දුව, 70.8.20.

9–272—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## වත්තල-මාබෝලෙ නගරය

### 3 වන අතිරේක අයවැය ලේඛනය—1970

| | මුදල රු. | ශ. |
|---|---|---|
| ජේ.—විදුලිබල කායඞාංශය :— | | |
| (3) සේවය හා නිවාසයන්ට කම්බි — | | |
| (ඒ) උපකරණ … … … | 10,000 | 0 |
| ජේ.—විදුලිබල කායඞාංශය :— | | |
| (5) ණය ගාස්තු— | | |
| (බී) මුල් මුදල ආපසු ගෙවීම … … | 100 | 0 |
| එකතුව … | 10,100 | 0 |

ඔලිවර් ගුරුසිංහ,
විශේෂ කොමසාරිස්,
වත්තල-මාබෝලෙ නගරය.

1970 අගෝස්තු මස 12 වන දින,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
වත්තල-මාබෝලෙ නගරය.

9–269—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### මුදල් රෙගුලාසි අංක 12 (II) යටතේ කෙරෙන අයදුම්පතයි

### 1970 අය-වැය ලේඛනය

1970 අය-වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේ යයි ගණන් බලන ලද පහත දක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂ වලට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1970 ක්වූ ජූලි මස 24 වෙනි දින පවත්වන ලද අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ මාසික රැස්වීමේ දී අංක 7 දරණ සභා තීරණයෙන් සම්මත වී තිබේ.

**1970 අය-වැය ලේඛණයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවෙයයි ගණන් බලනලද ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| බී.—මංමාවත්— | | |
| (14) අතිරේක දීමනා ... ... ... | 1,200 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය— | | |
| (1) සාමාන්‍ය : | | |
| (ඒ) පරීක්ෂකවරුන්ගේ හා වින්නඹු මාතාවන්ගේ පඩිනඩි | 3,500 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය— | | |
| (7) වෙළඳපලවල් හා ගාල් | | |
| (අයි) අතුරු දීමනා ... ... ... | 1,000 | 0 |
| එකතුව ... | 5,700 | 0 |

**අතිරේක වැය අවශ්‍ය වී තිබෙන ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| එෆ්.—මහජන ක්‍රීඩා— | | |
| (8) ක්‍රීඩාංගන අරමුදලෙන් කරනු ලබන සංවර්ධන වැඩ ... | 1,200 | 0 |
| ඩී.—නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි— | | |
| (4) නඩත්තු ... ... ... | 3,200 | 0 |
| බී.—මංමාවත්— | | |
| (8) සංවර්ධන ... ... ... | 375 | 0 |
| ඩී—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි— | | |
| (6) ණය ගෙවීම් | | |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස ... ... | 925 | 0 |
| එකතුව ... | 5,700 | 0 |

ආනන්ද සෝමවීර,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල,
1970 ක්වූ අගෝස්තු මස 11 වෙනි දින.

9-271—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගර සභාව

### අතිරේක අය වැය ලේඛනය අංක 1—1970

| | වැය ශීර්ෂය | රු. | ශ. | සම්මුති අංකය සහ දිනය |
|---|---|---|---|---|
| | ඒ. සී.— | | | |
| 1. | ඒ. 1—(සී) කාර්‍යාල කාර්‍ය සහායකයන් ... ... | 14,800 | 0 | ... 1970.6.21 දින දරණ සම්මුති අංක 2 |
| 2. | ඒ. 1—(ටී) විශ්‍රාම වැටුප් ... ... ... | 10,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 3. | ඒ. 2—(කේ) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... | 21,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 4. | ඒ. 4— ආධාර හා දීමනා ... ... ... | 1,000 | 0 | ... 1970.2 8 දින දරණ සම්මුති අංක 24 |
| 5. | බී. 1—(ඩී) කම්කරු වැටුප් ... ... | 45,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 6. | බී. 4— වීථි ආලෝකය ... ... ... | 40,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 7. | බී. 8— සංවර්ධන ගාස්තු ... ... ... | 25,000 | 0 | ... 1970.1.24 දින දරණ සම්මුති අංක 40 |
| 8. | ඩී. 4— නගර සභා ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කිරීම ... | 5,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 9. | ඊ. 1—(ඇෆ්) සනීපාරක්ෂාව, උපකරණ හා බෙහෙත් ... | 1,500 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 10. | ඊ. 1—(කේ) ජල ගැලීම් සඳහා කටයුතු ... ... | 3,000 | 0 | ... 1970.1.24 දින දරණ සම්මුති අංක 9 සහ 39 |
| 11. | ඊ. 2—(ඒ) කසළ ශෝධනය—වේතන ... ... | 80,000 | 0 | ... 1970.6.21 දින දරණ සම්මුති අංක 2 |
| 12. | ඊ. 7—(ඒ) වෙළඳ පොළවල් හා ගාල්—වේතන ... | 9,500 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 13. | එච්. 1— බල්ලන් විනාශ කිරීම ... ... | 1,500 | 0 | ... 1970.4. 8 දින දරණ සම්මුති අංක 53 |
| 14. | අයි. 3— කිරුම් හා මිනුම්—වේතන ... ... | 2,450 | 0 | ... 1970.6.21 දින දරණ සම්මුති අංක 3 |
| 15. | ජේ. 1—(ඇජ්) විදුලි බලය මිළයට ගැනීම ... ... | 1,60,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 16. | ජේ. 3—(ඒ) උපකරණ ... ... ... | 20,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 53 |
| 17. | ජේ. 3—(ඩී) මාපක යන්ත්‍ර ගාස්තු ... ... | 8,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 53 |
| 18. | ජේ. 4—(බී) වේතන, බාහිර කාර්‍ය මණ්ඩලය ... | 64,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| 19. | ජේ. 4—(ජී) අතිකාල ගෙවීම ... ... | 4,000 | 0 | ... 1970.7. 5 දින දරණ සම්මුති අංක 33 |
| 20. | ජේ. 6— දිර්ඝ කිරීම හා සංවර්ධණ ... ... | 5,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 53 |
| 21. | ඇම්. 1— වේතන ... ... ... | 4,000 | 0 | ... 1970.8. 8 දින දරණ සම්මුති අංක 52 |
| | එකතුව ... | 5,24,750 | 0 | |

ආර්. කේ. පියදස,
සභාපති, මාතර නගර සභාව.

නගර සභා කාර්‍යාලය,
මාතර, 1970 අගෝස්තු මස 21 වැනි දින.

9-281—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## කැලණිය සුළු නගර සභාව

### 1970 පරිපූරක වැය ලේඛන අංක

### විදුලි අංශය

| වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| විදුලි 8 ... | 80 | 0 |

වර්ෂ 1970 ක් වූ මාර්තු මස 10 වන දින පැවැත්වූ කැලණිය සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 9 දරණ යෝජනා ස්ථිරත්වයෙන් ඉහත සඳහන් පරිපූරක වැය ලේඛනය අනුමත කරන ලදී.

සභාපති,
කැලණිය සුළු නගර සභාව,

1970 ක්වූ ජූනි මස 8 වන දින,
කැලණිය සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරමි.

පළාත් පාලන සහකාර කොමසාරිස්,
(බටහිර කොට්ඨාශය).

1970 ක්වූ අගෝස්තු මස 17 දින,
කොළඹදීය.

9-257—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## බෙලිඅත්ත නගරය

### 1971 වර්ෂයට දේපළ බද්ද

බෙලිඅත්ත නගරය පාලනය කරන විශේෂ කොමසාරිස්, (256 වන අධිකාරය) වන සුළු නගර සභා ආඥාපනතේ 159 වැනි ඡේදය යටතේ 1970 වර්‍ෂයට පනවන ලද දේපළ බද්ද එලෙසම පහත පෙනෙන ලෙස 1971 වර්‍ෂයට පැන වූ බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බෙලිඅත්ත නගර සීමාව තුළ සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හත (7) බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් 1971 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දායින් අවසන් වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැක.

හෙ. පැ. විජේසිංහ,
විශේෂ කොමසාරිස්,
බෙලිඅත්ත නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
බෙලිඅත්ත නගරය,
බෙලිඅත්ත,
1970 අගෝස්තු 12 වැනි දින.

9–254/1—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත නගරය

### 1971 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරයේ) 4 වැනි වගන්තිය ප්‍රකාර බෙලිඅත්ත සුළු නගර සභා සීමාව තුළ තබා ගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රුපියල් එක (රු. 1) ක් බැගින්ද, සෑම ගෑනු සුනඛයෙක් සඳහා රුපියල් එක (1) ක් බැගින්ද, 1971 මාර්තු 31 වැනිදාට හෝ ඊට ප්‍රථම ගෙවන අයුරින් ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් 1971 වර්ෂයට පනවා ඇති බව බෙලිඅත්ත නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින් ප්‍රකාශනයට පත්කරනු ලැබේ.

හෙ. පැ. විජේසිංහ,
විශේෂ කොමසාරිස්,
බෙලිඅත්ත නගරය.

1970.8.25 වැනි දින,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
බෙලිඅත්ත නගරය, බෙලිඅත්ත.

9–254/2—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1966 ජූලි මස 8 වැනි දින අංක 14.703 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වෙනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 39, 40, 41 වැනි කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඒ. ජී. බී. දයානන්ද පතිරණ,
නාරම්මල ගම්සභාවේ සභාපති තැන.

1970.8.25 වෙනි දින,
ගම්සභා කාර්යාලයේදීය,
නාරම්මල.

9–261—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## 1952 කේ අංක 6 දරන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උතුරු බෝගොඩ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

"ගරු පළාත් පාලන ඇමැතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වන දින අංක 14,703 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වන දින අංක 14,835 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39, 40 හා 41 වන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියාත්මක වන අයුරින් සම්මත කර ගැනීමට උතුරු බෝගොඩ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.'

ඩබ්ලිව්. ඇම්. සී. වික්‍රමරත්න,
උතුරු බෝගොඩ ගම්සභාවේ සභාපති තැන.

1970 ජූලි 16 වැනි දින,
කැටවල, ලන්දවෙල පිහිටි
උතුරු බෝගොඩ ගම්සභා කාර්යාලයේදී ය.

9–280—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## වලස්මුල්ල සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

වලස්මුල්ල සුළු නගර සභා සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නො වන්නා වූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන හෝ දඩාවතේ යන නැතහොත් බැඳ නො තබන්නා වූ හෝ දක්කාගෙන නොයනු ලබන්නා වූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරන ලබන අයෙකු විසින් එවේලෙහි විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වන පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥා පනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශන ගැසට් පත්‍රයේ පළවන දින සිට සය මාසයක කලක් බලපවත්වනවා ඇත.

ජී. එම්. ඒප්. ද සිල්වා,
වලස්මුල්ල සුළු නගර සභාවේ සභාපති.

1970.8.24,
නගර සභා කාර්යාලයය,
වලස්මුල්ල.

9–264—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

## මාද්දුව උප නගර සභාව

### ජලභීතිකා රෝගය

මාද්දුව සුළු නගර සභා සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම සුළු නගර සභා සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක ගමුවන දඬුවලෙහි යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (476 වෙනි අධිකාරය වන) ජලභීතිකා ආඥාපනතේ II වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට හය මාසයක් ගතවනතුරු වලංගු වන්නේ ය.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
මාද්දුව උප නගර සභාව.

1970 ක්වූ අගෝස්තු මස 27 වෙනි දින,
මාද්දුව උප නගර සභා කාර්යාලයේ දීය.

9–258—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## බලපිටිය සුළු නගර සභාව

### 1970 වරිපනම් ලේඛනය

1970 වර්ෂය වෙනුවෙන් පිළියෙල වී ඇති බලපිටිය සුළු නගර සීමාවේ වරිපනම් ලේඛන රාජකාරි වේලාවන් තුළ මෙම කාර්යාලයයේදී පරීක්ෂා කිරීම පිණිස විවෘතව ඇති බව (256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 16ා වෙනි වගන්තිය යටතේ කියවෙන (252 වෙනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 235 (1) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. වසිමන් ද සිල්වා,
සභාපති.
සුළු නගර සභාව, බලපිටිය.

1970 ක්වූ අගෝස්තු මස 20 වෙනි දින,
බලපිටිය සුළු නගර සභා කාර්යාලයේදීය.

9–289—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනත (261 වැනි අධිකාරය)

පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වන වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කතලූව ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බවට 1965 ජනවාරි මස 8 වන දින අංක 14,:87 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද පොදු අතුරු ව්‍යවස්ථාවල 39. 40 හා 41 වැනි කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළකරවන දින සිට සම්මත කර ගැනීමට ගාල්ල දිස්ත්‍රික්කයේ කතලූව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදයේ) උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. සුගතදාස,
කතලූව ගම් සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 18 වන දින,
අහංගම, කතලූව ගම්සභාවේදී ය.

9–2೯2—70.9.4 දින අංක 14,922 දරන ගැසට් පත්‍රය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. පෝය දිනවලට පෙර දින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට | | පිටරට |
|---|---|---|---|---|---|---|
| | | | | රු. ශ. | | රු. ශ. |
| **එක් කොටසක්** | ... | ... | ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 43 50 | ... | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ-වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|---|
| | | රු. ශ. | | රු. ශ. |
| (අ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 50 | .. | 0 20 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | .. | 0 20 |
| (ආ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, වැනි කොටසේ එක ඡේදයක් ... . | 0 60 | ... | 0 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි